Article 12(1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. — ඔබේ අංකය / உமது இல. / Your No. — දිනය / திகதி / Date: 16/03/2018

පැමිණිලිකරු : ආර්.එම් ජයතිලක මයා.
නො : 370. මහව.
කොහිලේගෙදර.

වගඋත්තරකරුවන් : 01. විදුහල්පති.
කු/මලියදේව බාලිකා විද්‍යාලය.
කුරුණෑගල.

02. ලේකම්.
අධ්‍යාපන අමාත්‍යාංශය.
ඉසුරුපාය. බත්තරමුල්ල.

03. අධ්‍යක්ෂ (ජාතික පාසැල්)
අධ්‍යාපන අමාත්‍යාංශය.
ඉසුරුපාය. බත්තරමුල්ල.

පැමිණිලි අංකය : **HRC/656/16, HRC/2325/16**

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ. තම දරුවා 2013 වසරේදී ආදි ශිෂ්‍ය ගණය යටතේ කුරුණෑගල මලියදේව විද්‍යාලයට ඇතුළත් කිරීමට අයදුම් කළද ප්‍රමාණවත් ලකුණු නොලැබුනු බැවින් විද්‍යාලයට ඇතුළත් කිරීමට නොහැකි වූ බවත්. 2014 වසරේදී 2 ශ්‍රේණියේ ඇති වූ පුරප්පාඩුවක් සඳහා තම දරුවා ඇතුළත් කර ගන්නා ලෙසට ඉල්ලීමක් ඉදිරිපත් කළ බවත්ය. විදුහල්පතිවරයාද එම ඉල්ලීම අනුව දරුවා ඇතුළත් කිරීමට නිර්දේශ කර අමාත්‍යාංශය වෙත යොමු කළද අමාත්‍යාංශ ලේකම්වරයා ඊට අනුමැතිය ලබා දී නොතිබූ බවත්. 2015 වසරේදී 3 ශ්‍රේණියට ඇතුළත් කරන ලෙසට අභියාචනා කළද 42 සීමාව තුළ පුරප්පාඩු නොමැති බව තමාට දන්වන ලද බවත් සඳහන් කර ඇත. එසේ තිබියදී 44

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580/81/82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2505575 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

වැනියා ලෙස 2015 දෙසැම්බර් මස 3 බී ශ්‍රේණියට රුවන්ති උදානි රණසිංහ යන දරුවා ඇතුළත් කර ඇති බවත්. ඒ තුළින් පැමිණිලිකාරියට අසාධාරණයක් සිදුවී ඇති බවත් පැමිණිල්ලෙන් දක්වා ඇත.

පැමිණිලිකාරිය HRC/2325/16 යටතේ නැවත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ. 2016 වසරේ 4 වන ශ්‍රේණියේ සිට පාසලෙන් අස් වූ දරුවෙකු වෙනුවෙන් තමාගේ දරුවා විද්‍යාලයට ඇතුළත් කර ගන්නා ලෙසට නිර්දේශ කර ඇති බවත්, 4 වන ශ්‍රේණියේ පුරප්පාඩු නොමැති බව විදුහල මඟින් තමා වෙත දන්වා ඇති නමුත් 2016.05.16 වන දින උඩුවෙන වත්ත, දඹදෙණිය පදිංචි බිනරි අලගියවන්න දියණිය 4-ඊ ශ්‍රේණියට 45 වැනියා ලෙසට පාසලට ඇතුළත් කර ඇති බවත් ඒ තුළින් තමාට අසාධාරණයක් සිදුව ඇති බවත්ය.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-

මලියදේව විද්‍යාලයේ විදුහල්පති වගඋත්තරකරු ලෙස නම් කර තිබුණද අතරමැදි පන්ති සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ බලය විදුහල්පතිවරයාට නොමැති බැවින් මෙම දරුවා ඇතුළත් කර නොගැනීම හේතුකොටගෙන විදුහල්පතිවරයා පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර නොමැති බවට විදුහල්පතිවරයා විසින් කරන ලද කරුණු දැක්වීමේදී සඳහන් කර ඇත. වගඋත්තරකරුවන්ගේ එම කරුණු දැක්වීම පිළිගත හැකි කරුණු දැක්වීමක් වන අතර. විදුහල්පතිවරයා මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට නිර්දේශ කිරීමට නොහැක.

දෙවන සහ තුන්වන වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුගේ දරුවා විද්‍යාලයට ඇතුළත් කර ගැනීමට අනුමත සීමාව තුළ පුරප්පාඩු නොමැති බව පැමිණිලිකරුට දන්වා ඇති බව පාර්ශවයන් විසින් ඉදිරිපත් කර ඇති ලේඛන අනුව නිරීක්ෂණය වේ.

එමෙන්ම එසේ පුරප්පාඩු නොමැති බව සඳහන් කිරීමෙන් අනතුරුව 3 සහ 4 වන ශ්‍රේණියට වෙනත් දරුවන් දෙදෙනකු ඇතුළත් කර ඇති බව පැමිණිලි පාර්ශවය ප්‍රකාශ කර ඇති අතර. වගඋත්තරකරුවන් එය ප්‍රතික්ෂේප කර නොමැත.

ඒ අනුව මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ 2016.03.28 දින පැවැති පරීක්ෂණයේදී මේ සම්බන්ධයෙන් නැවත සලකා බලා පැමිණිලිකරු කැඳවා ලබාදිය හැකි සහන තිබේ නම් ඊට අවශ්‍ය කටයුතු කරන ලෙස වගඋත්තරකරුවන්ට දන්වා පරීක්ෂණ කටයුතු තාවකාලිකව අත්හිටුවා ඇත.

නමුත් පැමිණිලි පාර්ශවය අවස්ථා කිහිපයකදීම වගඋත්තරකාර අමාත්‍යංශය වෙත ගොස් අදාළ නිලධාරීන් හමුවුවද කිසිදු සහනයක් ලබා දී නොමැති බැවින් කොමිෂන් සභාව වෙත නැවත දන්වා ඇත.

ඉහත කාරණය පිළිබඳව ජාතික පාසැල් අධ්‍යක්ෂ විසින් 2016.11.24 දිනැති ලිපිය මඟින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දන්වා ඇත්තේ 'මෙම පැමිණිලිකරුගේ දරුවා මලියදේව විද්‍යාලයේ 2 වන

ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා විදුහල්පතිනිය විසින් නිර්දේශ ලබා දී ඇත්තේ 2014.10.09 වන දින බවත්. අදාළ විද්‍යාලයේ 2 වනශ්‍රේණියට පැමිණිලිකරුගේ දරුවාට අමතරව තවත් ඉල්ලීම් විශාල සංඛ්‍යාවක් අමාත්‍යාංශය වෙත ලැබී තිබුණු බවත්. ඊට අමතරව 2014.10.09 වන විට එම පාර්ශවයට අදාළව ජාතික පාසල් වලට දරුවන් ඇතුළත් කිරීමේ කටයුතු අවසන් කර තිබූ බවත්ය.'

පැමිණිලිකරු සඳහන් කර ඇති රුවන්ති උදානි රණසිංහ සිසුවිය මලියදේව බාලිකා විද්‍යාලයේ 03 වන ශ්‍රේණියට ඇතුළත් කර ඇත්තේ පැමිණිලිකාරියට දෙවන ශ්‍රේණියේ පුරප්පාඩු නොමැති බව දන්වා වර්ෂයකුත් මාස 02 කට පසුව බව වගඋත්තරකරුවන් ප්‍රකාශ කර ඇත. ශිෂ්‍යයෙකු ඇතුළත් කිරීමට ලබාදෙන නිර්දේශයන්/අනුමැතියන් වලංගු වන්නේ එම ලිපිය නිකුත් කළ ලිත් වර්ෂයන් සඳහා පමණක් බවද වගඋත්තරකරුවන් ප්‍රකාශ කොට ඇත. ඒ අනුව වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර නොමැති බව සඳහන් කර ඇත.

**නිරීක්ෂණ හා නිගමන :-**

පැමිණිලිකරුගේ දරුවා කුරුණෑගල මලියදේව විද්‍යාලයේ 2 වන ශ්‍රේණියට ඇතුළත් කිරීමට විදුහල්පතිවරයා නිර්දේශ කර ඇතත්. එම නිර්දේශ අනුව ඇතුළත් කිරීමට ජාතික පාසැල් අධ්‍යක්ෂ විසින් කටයුතු කර නොමැති බව නිරීක්ෂණය වේ. ඊට හේතුව ලෙස දක්වා ඇත්තේ අදාළ වර්ෂය සඳහා ජාතික පාසල් වලට දරුවන් ඇතුළත් කිරීම අවසන් කර තිබීම වේ.

එම වර්ෂයේ 2 වන ශ්‍රේණියට වෙනත් සිසුවෙකු ඇතුළත් කිරීමක් සිදුකර නොමැත. ඒ අනුව 2 වන ශ්‍රේණියට ඇතුළත් නොකිරීම සම්බන්ධයෙන් පැමිණිලිකරුට වෙනස්කමක් සිදුකර ඇති බවට එහිදී නිරීක්ෂණය නොවේ.

3 වන ශ්‍රේණියට පැමිණිලිකරුගේ දරුවා ඇතුළත් කරන ලෙසට ඉල්ලුම් කළද වගඋත්තරකරුවන් විසින් එය ප්‍රතික්ෂේප කොට ඇති අතර 3 වන ශ්‍රේණියට වෙනත් දරුවෙකු ඇතුළත් කර ඇති බව නිරීක්ෂණය වේ.

4 ශ්‍රේණියට පැමිණිලිකරුගේ දරුවා ඇතුළත් කිරීමට අයදුම්පත් යොමු කළද තම දරුවා ඇතුළත් කර නොමැති බවත්. තමාට පුරප්පාඩු නොමැති බව ලිඛිතව දන්වා වෙනත් දරුවෙකු විද්‍යාලයට ඇතුළත් කර ඇති බව පැමිණිලිකරු ප්‍රකාශ කර ඇතත්. වගඋත්තර පාර්ශවය එම කාරණයට අදාළව කිසිවක් මානව හිමිකම් කොමිෂන් සභාවට වාර්තා කර නොමැත.

3 වන සහ 4 වන ශ්‍රේණි වලට පැමිණිලිකරුගේ දරුවා ඇතුළත් කිරීමට පුරප්පාඩු නොමැති බව සඳහන් කරමින් වෙනත් දරුවන් දෙදෙනකු ඇතුළත් කර ඇතත්. එම දරුවන් කුමන පදනමක් යටතේ ඇතුළත් කර තිබේද යන්න පිළිබඳව වගඋත්තරකරුවන් කරුණු ඉදිරිපත් කර නොමැත.

පැමිණිලිකරුගේ දරුවා 2 ශ්‍රේණියට ඇතුළත් කිරීමට පුරප්පාඩු ඇති බැවින් විදුහල්පතිවරයා විසින් ජාතික පාසල් අධ්‍යක්ෂ වෙත පැමිණිලිකරුගේ දරුවා ඇතුළත් කරන ලෙසට නිර්දේශ කර තිබියදී

ජාතික පාසල් අධ්‍යක්ෂවරයා විසින් ඊට අනුමැතිය ලබා නොදීමත්. නැවත 3 සහ 4 ශ්‍රේණි වලදී පැමිණිලිකරුගේ දරුවා ඇතුළත් කිරීමට පැමිණිලිකරු විසින් කරන ලද ඉල්ලීම් ප්‍රතික්ෂේප කරමින් වෙනත් දරුවන් දෙදෙනකු ඇතුළත් කර තිබීමත්. 3 සහ 4 ශ්‍රේණි වලට ඇතුළත් කරන ලද දරුවන් එසේ ඇතුළත් කිරීමට අනුගමනය කළ ක්‍රමවේදය කුමක්ද යන්න පැහැදිලි කර නොතිබීමත් යන කරුණු සලකා බැලීමේදී අත්තනෝමතික ලෙස හා විනිවිදභාවයකින් තොරව එම කටයුතු සිදුවී ඇති බව නිරීක්ෂණය වේ. එම කාරණා අනුව පැමිණිලිකරුට නීතිය ඉදිරියේ අසමානව සලකා ඇති බවට හා වෙනස්කමකට භාජනය කර ඇති බවට පැමිණිලි පාර්ශවය විසින් වගඋත්තරකරුවන් වෙත ඉදිරිපත් කරන චෝදනාව ප්‍රතික්ෂේප කිරීමට ප්‍රමාණවත් හේතු වගඋත්තරකරුවන් විසින් ඉදිරිපත් කර නොමැති බවද නිරීක්ෂණය වේ.

ඉහත කී සමස්ථ කරුණු අනුව වගඋත්තරකරුවන් විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මඟින් සහතික කොට දී ඇති මූලික අයිතිවාසිකම පැමිණිලිකරු සම්බන්ධයෙන් උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව නිගමනය කරන ලදී.

නිර්දේශය :-

පැමිණිලිකරුගේ දරුවා වන ආර්.එම් හිමාෂා තියංගි රත්නායක දරුවා කුරුණෑගල මලියදේව විද්‍යාලයේ නියමිත ශ්‍රේණියට ඇතුළත් කර ගැනීමට කටයුතු කළ යුතුය.

2018.04.30 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව දෙවන හා තෙවන වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර. එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

Dr. N. D. Udagama
Chairperson
Human Rights Commission of Sri Lanka

සභාපති.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :- ලේකම්.
අධ්‍යාපන අමාත්‍යාංශය.
ඉසුරුපාය. බත්තරමුල්ල.

B/